**අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය**

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

# ලංසු සඳහා ආරාධනයයි

# බන්ධනාගාර දෙපාර්තමේන්තුව සඳහා ආහාර අයිතම ප්‍රසම්පාදනය - 2023/2024

**කොන්ත්‍රාත් අනන්‍යතා අංකය : PRI/SUP/Ration/2023**

01. බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙනුවෙන් සභාපති කැබිනට් මණ්ඩලය පත් කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව (SCAPC) බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ දිවයින පුරා විසිරී පවතින පහත සඳහන් ආයතන සඳහා ආහාර අයිතම සපයා ගෙනවිත් භාරදීම සඳහා මුද්‍රා තැබූ ලංසු යෝග්‍යතාපූර්ණ ශ්‍රී ලාංකික ව්‍යාපාර අස්ථිත්වයන්, නිෂ්පාදකයන්, ආයතන හා සීමිත වගකීම් සමාගම් සහ අනෙකුත් ආයතන වෙතින් මෙමගින් කැඳවනු ලැබේ. සැපයුම් කාලසීමාව 2023 ජූලි මස 16 වැනි දින සිට 2024 ජූලි මස 15 දින දක්වා වේ.

**වගුව - ආයතන සමූහය හා අනුරූපී ප්‍රභේදයන්**

| අංකය | ආයතනය | ලිපිනය | ප්‍රවර්ගයන් |
|---|---|---|---|
| 01 | අඹේපුස්ස | පබෝද මෙත් සෙවන සිර කඳවුර, අඹේපුස්ස. | 1. පාන්<br>2. පොල්<br>3. කරවල<br>4. වියලි සලාක<br>5. බිත්තර<br>6. මාළු<br>7. පළතුරු<br>8. මස්<br>9 කොළ එළවළු<br>10. සහල්<br>11 එළවළු |
| 02 | අඟුණකොළපැලැස්ස | ශ්‍රී ලංකා බන්ධනාගාරය, අඟුණකොළපැලැස්ස. | |
| 03 | අනුරාධපුරය | ශ්‍රී ලංකා බන්ධනාගාරය, අනුරාධපුරය. | |
| 04 | බදුල්ල | ශ්‍රී ලංකා බන්ධනාගාරය, බදුල්ල. | |
| 05 | මඩකලපුව | ශ්‍රී ලංකා බන්ධනාගාරය, මඩකලපුව. | |
| 06 | බූස්ස | ශ්‍රී ලංකා බන්ධනාගාරය, බූස්ස. | |
| 07 | කොළඹ රක්ෂිත බන්ධනාගාරය | කොළඹ රක්ෂිත බන්ධනාගාරය, කොළඹ 09. | |
| 08 | දළුපොත | තරුණ වැරදිකරුවන් සඳහා පුනරුත්ථාපන මධ්‍යස්ථානය, දළුපොත, පල්ලන්සේන, මීගමුව. | |
| 09 | දුම්බර | ශ්‍රී ලංකා බන්ධනාගාරය, දුම්බර, පල්ලෙකැලේ, කුණ්ඩසාලය. | |
| 10 | ගාල්ල | ශ්‍රී ලංකා බන්ධනාගාරය, ගාල්ල. | |
| 11 | හංගිලිපොල | බන්ධනාගාර වැඩ කඳවුර, හංගිලිපොල. | |
| 12 | යාපනය | ශ්‍රී ලංකා බන්ධනාගාරය, යාපනය. | |
| 13 | කඳුරුගස්ආර | බන්ධනාගාර වැඩ කඳවුර කඳුරුගස්ආර, තුංකම | |
| 14 | කළුතර | ශ්‍රී ලංකා බන්ධනාගාරය, කළුතර උතුර, කළුතර. | |
| 15 | කෑගල්ල | ශ්‍රී ලංකා බන්ධනාගාරය, කෑගල්ල. | |
| 16 | කුරුවිට | ශ්‍රී ලංකා බන්ධනාගාරය, කුරුවිට. | |
| 17 | මහර | ශ්‍රී ලංකා බන්ධනාගාරය, මහර, රාගම. | |
| 18 | මාතර | ශ්‍රී ලංකා බන්ධනාගාරය, මාතර. | |
| 19 | මීතිරිගල | බන්ධනාගාර වැඩ කඳවුර. | |
| 20 | මොණරාගල | ශ්‍රී ලංකා බන්ධනාගාරය, මොණරාගල | |
| 21 | මීගමුව | ශ්‍රී ලංකා බන්ධනාගාරය, මීගමුව. | |
| 22 | නව මැගසින් | නව මැගසින් බන්ධනාගාරය, කොළඹ 09. | |
| 23 | පල්ලෙකැලේ | එළිමහන් බන්ධනාගාර වැඩ කඳවුර, පල්ලේකැලේ. | |
| 24 | පොළොන්නරුව | ශ්‍රී ලංකා බන්ධනාගාරය, පොළොන්නරුව | |
| 25 | තල්දෙන | තරුණ වැරදිකරුවන් පුනරුත්ථාපන මධ්‍යස්ථානය, තල්දෙන. | |
| 26 | ත්‍රිකුණාමලය | ශ්‍රී ලංකා බන්ධනාගාරය, ත්‍රිකුණාමලය. | |
| 27 | වවුනියාව | ශ්‍රී ලංකා බන්ධනාගාරය, වව්නියාව. | |
| 28 | වාරියපොල | ශ්‍රී ලංකා බන්ධනාගාරය, වාරියපොල. | |
| 29 | වටරැක | තරුණ වැරදිකරුවන් සඳහා පුහුණු පාසල හා බන්ධනාගාර වැඩ කඳවුර වටරැක, පාදුක්ක. | |
| 30 | වීරවිල | බන්ධනාගාර වැඩ කඳවුර, ගොනාගමුව, උඩුවිල. | |
| 31 | වැලිකඩ | ශ්‍රී ලංකා බන්ධනාගාරය, වැලිකඩ, බේස්ලයින් පාර, කොළඹ 09. | |

1.1 සෑම ආහාර අයිතමයක් පිළිබඳව විස්තර හා පිරිවිතරයන් ලංසු ලිපි ලේඛනයන්හි දක්වා ඇත.

1.2 සෑම බන්ධනාගාර ආයතනයක් සඳහා සහ ආහාර ප්‍රභේදයන් සඳහා ලංසු ලැබීමට සැලැස්වීම.

1.2.1 එක් ආයතනයක් සඳහා පදනම යටතේ හා ප්‍රවර්ගය පදනම යටතේ වෙන් වශයෙන් ලංසු ලැබීමට සැලස්විය යුතුය. බන්ධනාගාරයක විශේෂිත ප්‍රවර්ගයක් සඳහා ලංසුකරු විසින් එම ප්‍රවර්ගය යටතේ ඇති සියලුම අයිතම සඳහා ලංසු ඉදිරිපත් කළ යුතුය. සියලුම අයිතම සඳහා ලංසු ඉදිරිපත් කිරීමට ලංසුකරු අපොහොසත් වුවහොත් එබඳු ලංසු ප්‍රතිචාරාත්මක නොවන ලංසු සේ සලකනු ලැබේ.

1.2.2 ගැනුම්කරු විසින් ඇගයීමට ලක්කරනු ලබන ලංසුකරුගේ ධාරිතාව අනුව ඕනෑම ලංසුකරුවකුහට එක් ආයතනයක් හෝ ආයතන එකකට වැඩි ගණනාවකට අදාළ ප්‍රවර්ගයේ අයිතම සඳහා වෙන් වශයෙන් ලංසු ඉදිරිපත් කළ හැක.

02. තෝරාගත් සැපයුම්කරුටත්, අදාළ ආයතනය සඳහා ප්‍රවාහන කටයුතු සූදානම් කිරීම ගිවිසුමේ කොටසක් ලෙස ඔවුන්ගේ වගකීම වේ. සියලුම අදාළ බෙදහැරිය යුතු මධ්‍යස්ථාන ඉහත සඳහන් වගුවේ දක්වා ඇත.

03. මෙම ලංසුකරණය 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.2 වගන්තිය යටතේ ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය යටතේ පැවැත්වේ. විදේශීය ලංසුකරුවන්හට ලංසුකරණය සඳහා අවසර හිමි නොවේ.

04. ලංසුකරණය සඳහා යෝග්‍යතාව ලැබීමට ලංසුකරු දේශීය ව්‍යාපාර ලියාපදිංචිය සහිත ශ්‍රී ලාංකික ව්‍යාපාර අස්ථිත්වයක් නිෂ්පාදකයකු, ආයතනයක්, සීමිත වගකීම් සමාගමක්, ආයතනයක් විය යුතු අතර, මෙම දැන්වීම පළ වන දිනයේ අදාළ ආහාර අයිතමය සැපයීමේ නිරත වී සිටින ආයතනයන්ද විය යුතුය. ලංසුකරුවන් අසාධු ලේඛනගත වූ ලංසුකරුවන් නොවිය යුතුය.

05. අවශ්‍යතා තහවුරු කරන සියළු ලියකියවිලි ලංසුව සමග යොමු කල යුතුයි.ලංසු ඇගයීමේ විස්තරාත්මක ක්‍රම වේදය, ලංසු ලියවිල්ලේ III වන වගන්තියේ විස්තර කරනු ලබයි.පහත අවම සුදුසුකම් අවශ්‍යතා , මූලික ලංසු ඇගයීම සඳහා යොදා ගනු ලැබේ.

5.1 ආසන්නම පෙර වසර 2 සඳහා අවම සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම ,ලංසු ලියකියවිලිවල I වන ඇමුණුම අනුව විය යුතු අතර අදාල විගණන කළ මූල්‍ය ප්‍රකාශන මගින් තහවුරු කළ යුතුවේ.(2020/2021 හා 2021/2022).

5.2 ආසන්නතම පෙර වසර 2 සදහා , අවම සාමාන්‍ය කාරක ප්‍රාග්ධනය ලංසු ලියකියවිලි වල I ඇමුණුම අනුව විය යුතු වන අතර අදාල විගණන කළ මූල්‍ය වාර්තා මගින් තහවුරු කල යුතුයි (2020/2021 හා 2021/2022)

5.3 ලංසුකරු බැංකුවකින් හෝ මූල්‍ය ආයතනයකින් කාරක ප්‍රාග්ධනය සොයා ගැනීම සඳහා බැංකුවකින් හෝ මූල්‍ය ආයතනයකින් ණය පහසුකම් ඉල්ලා සිටිය හොත් ,එම පහසුකම් විශේෂයෙන්ම මෙම ප්‍රසම්පාදනය සඳහා සීමා විය යුතුයි. (ඇමුණුම VII)

5.4 ලංසුකරුට රජයේ ආයතනවලට පසුගිය වසර 06 තුල ආහාර ද්‍රව්‍ය සැපයීමේ ක්ෂේත්‍රයේ සනාථ කල හා සතුටුදායක වසර 2 ක පළපුරුද්දක් තිබිය යුතුයි.(III හා IV ඇමුණුම්).

5.5 නැවුම් ආහාර ද්‍රව්‍ය සැපයීම හා ගෙනවිත් භාරදීම සඳහා ලංසුකරු සතුව අවශ්‍ය ගබඩා පහසුකම් ,ශීත/ශීත කාමර පහසුකම් හා ප්‍රවාහනය සඳහා අධිශීත (ෆ්‍රීසර්)ට්‍රක් රථ තිබිය යුතුයි.(තමාගේම හෝ කුලී හෝ බදු පදනම මත ලබා ගත් වශයෙන්) මේ සම්බන්ධයෙන් අමතර විස්තර ලංසු ලිපි ලේඛණ වල සපයා ඇත. (ඇමුණුම V –A සහ V-B)

5.6 වියළි ආහාර අයිතම සම්බන්ධයෙන් ලංසුකරු සතුව අවශ්‍ය ගබඩා පහසුකම් / ගුදම් හා ප්‍රවාහණ පහසුකම් තිබිය යුතුයි.(තමාගේ හෝ කුලී හෝ බදු පදනම මත ලබා ගත් වශයෙන්) මේ සම්බන්ධයෙන් අමතර විස්තර ලංසු ලිපි ලේඛණ වල ලබා දි ඇත. (ඇමුණුම V- A හා V-B ).

06. ලංසු ලිපි ලේඛන ලබාගැනීමට පෙර **www.prisons.gov.lk** පලකර ඇති ටෙන්ඩර් දැන්වීම පරිශීලනය කරන ලෙස සියලුම ලංසුකරුවන්හට අවධාරණයෙන් දන්වා සිටිනු ලැබේ.

07. ලංසු ලිපි ලේඛන නිකුත් කිරීම ලංසු විවෘත කිරීම සඳහා අදාළ දින වකවානු පහත සඳහන් පරිදි වේ.

| | | |
|---|---|---|
| **ලංසු ලිපි ලේඛන නිකුත් කිරීම** | : | 2023.03.09 වන දින පෙ.ව. 9.00 සිට 2023.03.30 වන දින ප.ව. 3.00 දක්වා. |
| **පූර්ව ලංසු රැස්වීම** | : | 2023.03.20 |
| **පැහැදිලි කිරීම් ලබාගැනීමට ඉල්ලුම් කිරීමේ අවසාන දිනය** | : | 2023.03.20 ලංසු ලිපි ලේඛන භාරගන්නා අවසන් දිනය හා වේලාව 2023.03.31 වන දින පෙ.ව. 10.00 ට. |
| **ලංසු ලිපි ලේඛන විවෘත කරනු ලබන දිනය වේලාව හා ස්ථානය** | : | ලංසු භාර ගැනීම අවසන් වූ වහාම (2023.03.31 වන දින පෙ.ව. 10ට) ප්‍රධාන සම්මන්ත්‍රණ ශාලාව, 2 වන මහල, අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේදී, ලිපිනය : නො 10, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10. |

08. පූර්ව ලංසු රැස්වීම 2023.03.20 වන දින පෙ.ව. 10.00 ට ප්‍රධාන ශ්‍රවණාගාරය, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, බන්ධනාගාර මූලස්ථානය, නො. 150, බේස්ලයින් පාර, කොළඹ 09 යන ලිපිනයේදී පැවැත්වෙයි.

09. ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙල කරන ලද සම්පූර්ණ ලංසු ලිපි ලේඛන කට්ටලයක් ලංසුකරුවන්හට, ලිඛිත අයදුම්පතක් 14 ඡේදයේ දක්වා ඇති ලිපිනයට සැපයුම් කොමසාරිස් වෙත යොමු කිරීමෙන් හා ආපසු නොගෙවන ගාස්තුව ගෙවීමෙන් අනතුරුව මිලදී ගත හැක. සෑම ආයතනයක්/ සෑම ලංසුවක් සඳහාම අදාළ වන ආපසු නොගෙවන ගාස්තුව 2016.06.17 දතම දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 06/2016 පරිදි වේ. (14 වන ඡේදයේ දී ඇති ලිපිනයෙන් සැපයුම් කොමසාරිස් වෙතින්, අදළ ආපසු නොගෙවන ගාස්තු උපලේඛනය ලබාගත හැක)

10. ලංසු එවීම සඳහා ලංසු ලිපි ලේඛනයන්හි දක්වා ඇති ෆෝරම පමණක් පාවිච්චි කළ යුතුය. ලිපි ලේඛන පැකට් 1 ලෙස අවශ්‍ය ලිපි ලේඛන මුද්‍රා තැබූ කවරයක බහා හා මුද්‍රා තැබූ ලංසු මුද්‍රා තැබූ කවරයක බහා පැකට් 2 ලෙසද, අනුපිටපත් සමගින් මුද්‍රා තැබූ කවරයක බහා ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනවිත් භාරදීම අධ්‍යක්ෂ ප්‍රසම්පාදන, අධිකරණ බන්ධනාගාර කටයුතු සහ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය, නො. 10, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10 යන ලිපිනයට සිදුකළ යුතුය. නැතහොත් ඉහත සඳහන් ලිපිනයේ මේ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දී ඇති අදළ දිනයට හා වේලාවට පෙර බහාලිය යුතුය.

11. ලංසු අවම වශයෙන් 2023 අගෝස්තු 31 වන දින දක්වා වලංගු භාවයෙන් යුක්ත විය යුතුය.

12. ලංසු අවම වශයෙන් 2023 ඔක්තෝබර් මස 2 වන දින දක්වා වලංගු ලංසු සුරක්ෂණයක් සමග බන්ධනාගාර කොමසාරිස් ජනරාල් යන ලිපිනයට එවිය යුතුය. ලංසු සුරක්ෂණය බැංකුවේ මුල් ලිපි ශීර්ෂයක් මගින් නිකුත් කරන ලද කොන්දේසි විරහිත ඒක්ෂණ, මහ බැංකුව විසින් අනුමත ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකුවක් මගින් නිකුත් කරන ලද සුරක්ෂණයක් විය යුතුය. 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව විශේෂිත ලංසුවක් සඳහා වන ලංසු වටිනාකම දක්වන උපලේඛනය ලංසු ලිපි ලේඛන සමග සපයනු ඇත.

13. අභිලාෂී ලංසුකරුවන්හට මේ පිළිබඳව වැඩිමනත් විස්තර කොමසාරිස් (සැපයුම්) බන්ධනාගාර මූලස්ථානය වෙතින් ලබාගත හැකි අතර, කාර්යාලයේදී නොමිලේ ලංසු ලිපි ලේඛන පරීක්ෂාව පහත 14 ව පරිච්ඡේදයේ දී ඇති ලිපිනයේදී 2023 මාර්තු මස 09 වන දින සිට 2023 මාර්තු මස 30 වන දින දක්වා රාජකාරී දිනයන්හිදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා සිදුකළ හැක.

**ඉහත සඳහන් ලිපිනය වනුයේ :**

| | | |
|---|---|---|
| **අවධානය** | : | **බන්ධනාගාර කොමසාරිස් (සැපයුම්)** |
| **ලිපිනය** | : | **බන්ධනාගාර මූලස්ථානය,<br>නො. 150, බේස්ලයින් පාර, කොළඹ 09.** |
| **දුරකථනය** | : | **011-4677177** |
| **ෆැක්ස්** | : | **011-4677180, 0112678531** |
| **විද්‍යුත් තැපෑල** | : | supply prisons@gmail.com |

**සභාපති, කැබිනට් මණ්ඩලය පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව.**
**(බන්ධනාගාර දෙපාර්තමේන්තුව සඳහා ආහාර අයිතම ප්‍රසම්පාදනය 2023/2024)**
**අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,**
**2023.03.09**